# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,696 — 1966 මැයි 20 වැනි සිකුරාද — 1966.5.20

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාගවලට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන .. .. .. | 359 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන .. .. .. | — |
| සහතුරු–ඇබෑර්තු .. .. .. .. | 361 | අය–වැය ලේඛන .. .. .. | 366 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය .. .. .. | 364 | දේපළ විකිණීම් .. .. .. | — |
| අතුරු ව්‍යවස්ථා .. .. .. .. | — | මාර්ග කොමිටි දැන්වීම් .. .. .. | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | 366 | විවිධ දැන්වීම් .. .. .. | 367 |


## පළාත් පාලන නිවේදන

ඇල්. ඩී.—බී. 3/65

### නගර සභා ආඥාපනත

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 10 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමතිවරයා විසින් පනවන ලද ආඥාවයි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1966 මාර්තු මස 5 වැනි දින,
කොළඹ දී ය.

ආඥාව

1. රත්නපුර නගර සභාවේ දැනට නිලයේ සිටින සභිකවරුන්ගේ නිල කාලය අවසාන විය යුතු දිනය වශයෙන් 1966 ජූනි මස 30 වැනි දිනය වෙනුවට 1967 ජනවාරි මස 31 වැනි දිනය මෙයින් නියම කරනු ලැබේ.

5–660 —66.5.20 දින අංක 14,696 දරන ගැසට් පත්‍රය

---

ඇල්. ඩී.—බී. 69/41.
එල්. ජී. ඩී.—ජී. අයි. 1/9

### ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වන අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 37 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති මුරුගේසන් තිරුචෙල්වම් වන මම, ඒ වගන්තිය යටතේ මාතලේ දිස්ත්‍රික්කයේ උඩුගොඩ උඩසිය පත්තුව නැගෙනහිර ගම් ප්‍රදේශය තුළ ඉඩම් බද්දක් පනවා අය කිරීමට එකී ගම් ප්‍රදේශයේ ගම්සභාවට මේ නිවේදනයෙන් බලය පවරමි.

මුරුගේසන් තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1966 අප්‍රේල් මස 23 වැනි දින,

5-675—66.5.20 දින අංක 14,696 දරන ගැසට් පත්‍රය

---

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1966 පෙබරවාරි මස 11 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

## පළාත් පාලන සේවය

### රාජ්‍යභාෂා පනත ක්‍රියාත්මක කිරීම පිළිබඳ කොන්දේසි

(අ) පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදුව, අංක 13,387 සහ 1962 නොවැම්බර් මස 9 වෙනි දින දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද රාජ්‍යභාෂා පනත ක්‍රියාත්මක කිරීම පිළිබඳ කොන්දේසි 2, 3 සහ 4 වැනි ඡේද මකා දැමීමෙන්, (එනම්: 1960.1.29 වෙනි දිනට පෙර සේවයට බඳවා ගන්නා ලද නිලධාරීන් සඳහා සිංහල ප්‍රවීණතා පරීක්ෂණ) මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(ආ) අංක 14,046 සහ 1964 මැයි මස 29 වෙනි දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද රාජ්‍යභාෂා පනත ක්‍රියාත්මක කිරීම පිළිබඳ කොන්දේසි :

(අ) පළමුවැනි වගන්තියේ 1, 2 සහ 3 දරන ඡේද මකා දැමීමෙන් (එනම්: 1960.1.29 වෙනි දිනට පෙර සේවයට බඳවා ගන්නා ලද පළාත් පාලන සේවයෙහි ආදි ප්‍රවේශකයින් සඳහා වූ සිංහල ප්‍රවීණතා පරීක්ෂණ)

(ආ) දෙවැනි වගන්තියෙහි (iii) වැනි අතුරු ඡේදය මකා දැමීමෙන් (එනම්: ආදි ප්‍රවේශකයින් පත්වීමෙහි ස්ථිර කරනු ලැබීම) සහ

(ඇ) සිවුවැනි වගන්තිය මකා දැමීමෙන් (එනම්: වෛකල්පික විශ්‍රාම ගැනීමේ වියට එළඹෙන නිලධාරීන්ගේ සේවා කාලය දීර්ඝ කිරීම) මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(ඇ) අංක 13,387 සහ 1962 නොවැම්බර් මස 9 වැනි දින දරන ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරන ලද කොන්දේසිවල තෙවැනි ඡේදය යටතේ සහ අංක 14,046 හා 1964 මැයි මස 29 වෙනි දින දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද කොන්දේසිවල 1 (ඒ) සහ (ඞී) වගන්තිය යටතේ අත්හිටුවන ලද සහ/හෝ නතර කරන ලද වැටුප් වැඩිවීම්, පළාත් පාලන සේවා රෙගුලාසිවල 53 වැනි රෙගුලාසිය යට යටත්ව, පළාත් පාලන සේවයෙහි ආදි ප්‍රවේශකයින් හට දැන් ආපසු දිය හැක. (එනම්: 1960.1.29 වෙනි දිනට පෙර සේවයට බඳවා ගන්නා ලද නිලධාරීහු).

මෙම නිවේදනයෙහි දක්වා ඇති තීරණයන්හි සහ මීට කලින් වූ කිසියම් තීරණයක් අතර කිසිදු ප්‍රතිවිරෝධතාවයක් තිබේ නම් මෙම නිවේදනයෙහි දක්වා ඇති තීරණය වලංගු වේ.

ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
සභාපති.

1966 අප්‍රේල් 26 දින,
කොළඹ, තැ. පෙ. 530,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේදිය.

5–757—66.5.20 දින අංක 14,696 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥාපනත

### 13 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

1961 අංක 60 දරණ ගම්සභා (සංශෝධිත) පනතින් සංශෝධිත (257 වැනි අධිකාරිය) ගම්සභා ආඥාපනතෙහි 13 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, නුවරඑළිය පාලන දිස්ත්‍රික්කයේ සහකාර පළාත් පාලන කොමසාරිස් ඩොනල්ඩ් ඊ. අබේසිංහ වන මම, නුවරඑළිය දිස්ත්‍රික්කයේ පල්ලෙපනේ ගම් සභාවේ අංක 7 දරණ කොට්ඨාශයේ නියෝජිත වියලමුන්නේ ගෙදර ලොකු මුදියන්සේ මහතා සභාවට දැන්වීමක් නොකර පිළිවෙළින් සභාවේ රැස්වීම් වාර තුනකට වැඩි ගණනකට, තමන් තෝරා පත්කර ගැනීමෙන් පසු නොපැමිණි බව ගැන සෑහීමකට පත්ව, නුවරඑළිය දිස්ත්‍රික්කයේ පල්ලෙපනේ ගම් සභාවේ අංක 7 දරණ කොට්ඨාශයේ නියෝජිත වියලමුන්නේ ගෙදර ලොකු මුදියන්සේ මහතා මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළකිරීමේ දින සිට තම සභිකත්වය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

ඩොනල්ඩ් ඊ. අබේසිංහ,
සහකාර පළාත් පාලන කොමසාරිස්,
නුවරඑළිය පාලන දිස්ත්‍රික්කය.

1966ක්වූ මැයි මස 7 වැනි දින,
නුවරඑළියේ දීය.

5–659—66.5.20 දින අ.ක 14,696 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥාපනත

### ගම්සභා ආඥාපනතේ 17 වැනි වගන්තිය යටතේවූ දැන්වීමයි

1961 අංක 60 දරණ ගම්සභා ආඥාපනතේ (257 වැනි අධිකාරය) 17(5) දරණ වගන්තියෙන් මා කෙරෙහි පැවරී ඇති බලයේ ප්‍රකාර උතුරු (ඉහළ) කොටසේ පළාත් පාලන සහකාර කොමසාරිස් සිවසුබ්‍රමානියම් චින්මයානන්දගුරු මානික්කවාසගර් වන මා විසින්, මෙහි පහත උපලේඛනයේ 1 වැනි තීරුවේ සඳහන් ගම්කාර්‍ය සභාවට සභාපති කෙනෙකු පත්කරගැනීම සඳහා 2 වැනි තීරුවේ සඳහන් දිනයේදී, 3 වැනි තීරුවේ සඳහන් වේලාවේදී, 4 වැනි තීරුවේ සඳහන් ස්ථානයේදී ද, රැස්වීමක් මෙයින් කැඳවා සිටිනු ලැබේ.

ඇස්. සී. මානික්කවාසගර්,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
උතුරු කොටස (ඉහල), යාපනය.

1966ක්වූ මැයි මස 6 වැනිද,
යාපනයේ උතුරු (ඉහල)
පළාත් පාලන කාර්‍යාලයේදීය.

### උපලේඛනය

| 1 වැනි තීරුව | 2 වැනි තීරුව | 3 වැනි තීරුව | 4 වැනි තීරුව |
|---|---|---|---|
| ගම්කාර්‍ය සභාවේ නම | දිනය | වේලාව | ස්ථානය |
| අර්ලාලෛ | ... 1966. 6. 1 | ...පෙ.ව.10.00 | ... අර්ලාලෛ. ගම්කාර්‍ය සභා කාර්‍යාලය |

5–661—66.5.20 දින අංක 14,696 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥාපනත

### 17 වැනි වගන්තිය යටතේවූ දැන්වීම

1961 අංක 60 දරණ පනතින් සංශෝධිත ගම්සභා ආඥාපනතේ (257 වැනි අධිකාරය) 17 (5) දරණ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලයේ ප්‍රකාර ඌවේ පළාත් පාලන සහකාර කොමසාරිස්, මුතුබණ්ඩාර සමරකෝන් වන මම, මොණරාගල දිස්ත්‍රික්කයේ කොටගම ගම්සභාවට සභාපති වරයෙකු පත්කර ගැනීම සඳහා, රැස්වීමක්, 1966 මැයි මස 28 වෙනි දින පෙරවරු 10ට කොටගම ගම්සභා කාර්යාලයේදී කැඳවන බැව් මෙයින් නිවේදනය කරමි.

මුතුබණ්ඩාර සමරකෝන්,
ඌවේ පළාත් පාලන සහකාර කොමසාරිස්.

1966.5.13 දින,
බදුල්ලේදී ය.

5–516—66.5.20 දින අංක 14,696 දරන ගැසට් පත්‍රය

(ඉහත සඳහන් (iii) (අ), (ආ) සහ (v) දරන කොන්දේසි දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් සේවයට බඳවා ගනු ලැබූවන් කෙරෙහි යෙදෙයි.)

සටහන.—මේ කරුණ සම්බන්ධයෙන් "නව ප්‍රවේශක නිලධාරි" යන පදයෙන් අදහස් කරන්නේ 1960 ජනවාරි 29 වැනි දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීම්වලට අනුකූලව පළාත් පාලන සේවා තනතුරුවලට පත්කර ගනු ලබන නිලධාරීන්ය.

5. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවකු විසින්ම, තමා ලාංකිකයකු බවට සැහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම සම්බන්ධ සියලුම කටයුතු සඳහා "ලාංකික" යන වචනයෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

6. සේවා මුක්ත භටයින් සඳහා අනුග්‍රහ.—(අ) සේවා මුක්ත වූ අයදුම්කරුවනට, ඔවුන්ගේ නිත්‍ය භට හමුදා සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම් කර ඇති තනතුරුවලට නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය භට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියෙහි නියමිත අඩුම, අධ්‍යාපන සුදුසුකම් ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

7. වයස පිළිබඳ අනුග්‍රහය.—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවක් නැත නොතකාම අයදුම්පත් එවීමට පළාත් පාලන සේවා සාමාජිකයන්ට පුළුවන.

8. වෙනත් අවශ්‍ය කරුණු.—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම නමින් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලයේ සභාපති මඟින් හෝ නාගරික කොමසාරිස්වරයා මඟින් හෝ ඉදිරිපත් කළ යුතුය.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයෙහි ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුව හොත් ඔවුන් ස්වකීය තනතුරුවලින් නිදහස්කළ හැකි ද නැත්ද යන්න සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන්කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වූව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්යයෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට සම්පූර්ණයෙන් නොගැළපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) අයදුම්පත් මෙහි පහත දැක්වෙන ආකෘතියට අනුව සාරානුකූලව පිළියෙල කොට, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ. අයදුම් පතක් තැපෑලේදී ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම් පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුම්ම ඒ අවදානමට මුහුණ පාති.

## අනාගතකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පත් ආකෘතිය

### පළාත් පාලන සේවය

සැ. යු.—(i) අයදුම්පත්‍ර මෙහි පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුර අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන් අයදුම්පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම්පත්‍ර සභාපතිගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සකලයෙන්ට සුදුසු බව නිශ්චය කරගනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැලකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවෝ ස්වකීය අයදුම්පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි-සිංහල, දෙමළ යන භාෂාවලින් සමත් වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාළ වෙනම වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

### ——— තනතුර සඳහාවූ අයදුම්පතයි

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය : ———.

(ආ) ඉල්ලුම් කර සිටින තනතුර :———.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :———.

ජාතිය :———.

(එම ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත් සැඳහුම් අංකයත් සඳහන් කරන්න)

3. තැපැල් ලිපිනය :———.

(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස අවුරුදු——, මාස——, දින——.

(ආ) උපන් දිනය :———.

| අවුරුද්ද | මාසය | දිනය |
| --- | --- | --- |
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :———.

(ආ) අයදුම්කරුගේ පියා :———.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :———.

(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :———.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඉ) හෝ පිරවිය යුතුයි.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :———.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග :—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ හෝ ශිල්පීය සුදුසුකම්. ලැබූ දින හා ආයතනවල නම් :————.

10. ඉගෙනගත් පාඨශාලාව හා එයින් අස්වූ දිනය :————.

11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්‍ෂා (පත් වූ දිනයන් හා අස්වූ දිනයන් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න):————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්‍ෂා වෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සවිහන් (තනතුරු), පළාත් පාලනායතන හා කාලසීමාවන් : ————.

(ඈ) දැනට කරන රක්‍ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :

(i) තනතුරේ පදවි නාමය. ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප් හා වැටුප් ක්‍රමය : ————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද :————.

(ඉ) සේවා මුක්ත හටයෙක් නම් —

සේනාංකය තරාතිරම, සේවය බැඳුන දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :————.

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද? එසේ නම් ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේ ද? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස් ද? එසේ නැත් නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ).

මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සභාපති,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැ. පෙ. 530,
කොළඹ 1.

---

## පළාත් පාලන සේවය

### සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි.

2. තෝරාගනු ලබන අයදුම්කරු, පළමුකොටම කොළඹ නාගරික සභාවට පත්කරනු ලබන අතර, කොළඹ නාගරික සභා සීමාව තුළ වාසය කිරීමට ඔහුට නියම කරනු ලැබේ. තවද, පෞද්ගලික වෘත්තියෙහි යෙදීමට ඔහුට අවසර නැත.

3. වැටුප.—තනතුරට නියමිත වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 8,880—9×480—රු. 13,200 වේ. මෙම වැටුප් ක්‍රමයෙහි රු. 11,280 යන වාර්ෂික වැටුපෙහි ඇවුරුදු නැවැත්මක් සහ රු. 11,760 යන වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමක් ඇත. තෝරාගනු ලබන අයදුම්කරු, ඔහුගේ සුදුසුකම් සහ පළපුරුද්ද අනුව වැටුප් ක්‍රමයේ වැටුප් පෙත්තක තැබිය හැක.

4. ඉහත වූ 3 වන ඡේදයෙහි සඳහන් වැටුපට අතිරේකව, පහත සඳහන් ආකාරයට විශ්‍රාම වැටුප් රහිත දීමනාවක් ද, පත්කරනු ලබන නිලධාරියාට ගෙවනු ලැබේ :—

සේවයේ පළමුවන අවුරුදු හය සඳහා වර්ෂයකට රු. 1,200යි; එයින් පසු රු. 11,760 වාර්ෂික වැටුප් පෙත්තට පැමිණෙන තුරු සහ ඒ වැටුප් පෙත්තට පැමිණි දින සිට අවුරුදු හතරක් යනතුරු වර්ෂයකට රු. 1,800 යි. ඊළඟ අවුරුදු හතරක් සඳහා වර්ෂයකට රු. 2,400යි; ඊළඟ අවුරුදු හතර සඳහා වර්ෂයකට රු. 3,000යි. ඉන්පසු වර්ෂයකට රු. 3,600 යි.

5. තෝරාගනු ලබන අයදුම්කරු මාරු කිරීමට යටත් වන්නේ ය.

6. අවශ්‍ය සුදුසුකම්.—අයදුම්කරුවන් ඇම්. බී. බී. ඇස්. (ලංකා) උපාධිය හෝ ඊට සමාන හෝ ඊට උසස් වෙනත් වෛද්‍ය සුදුසුකමකින් යුක්ත වූවන් විය යුතු අතර, පහත සඳහන් විභාග වලින් එකකිනුත් සමත්ව සිටිය යුතුය :—

(i) ඇම්. ඩී. (ලන්ඩන්) රාජ්‍ය වෛද්‍ය විද්‍යාව.

(ii) ඩී. පී. එච්. (බ්‍රිතාන්‍ය විශ්ව විද්‍යාලයක හෝ ටොරොන්ටෝහි විශ්ව විද්‍යාලයේ හෝ ඔස්ට්‍රේලියාවේ විශ්ව විද්‍යාලයක).

(iii) ඇම්. පී. එච්. (ලංකාව පිළිගෙන ඇති අමෙරිකා එක්සත් ජනපදයේ හෝ කැනඩාවේ විශ්ව විද්‍යාලයක හෝ වෛද්‍ය විද්‍යාලයක).

(iv) ඇම්. ආර්. සී. පී. (ලන්ඩන්) හෝ (එඩින්බරෝ) ජන සෞඛ්‍ය.

7. මේ ගැසට් පත්‍රයේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

8. ඉල්ලුම් පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට, 1966 ජූනි මස 7 වැනි දිනට හෝ ඊට පළමු, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන සේ එවිය යුතුයි.

සඳහන් කරන ලද ආකෘති පත්‍රයෙහි 9 වැනි ඡේදය වෙනුවට, පහත සඳහන් කරුණු යොදාගත යුතුයි :—

> "9. ලබා ඇති වෛද්‍ය සහ වෘත්තීය සුදුසුකම්, ඒවා ලබා ගත් දින වකවානු සහ ආයතනයන්ගේ නම්. සහිතව :—"

9. අයදුම්පත්‍ර හෝ අදාළ අනිකුත් ලියුම් එවිය යුත්තේ, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

10. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස් වරයා හෝ සභාපතිවරයා වෙත අවසාන දිනට පෙර ලැබුණු බවට සහතික කර, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

11. සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගේ පමණක් ඉල්ලුම්පත් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

1966 මැයි මස වැනි දින,
තැ. පෙ. 530,
කොළඹ.

5–690—66.5.20 දින අංක 24,696 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය—යන්ත්‍රාගාර ක්‍රියාකරු තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි. තෝරාගනු ලබන අයදුම්කරු පළමුවරට කොලොන්නාව පළාත් ආණ්ඩු සභාවට පත් කරනු ලැබේ :—

2. වැටුප.—තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය : රු. 1,320—72—රු. 2,184.

3. අවශ්‍ය සුදුසුකම්.—

(අ) වයස :—1966.6.7 දිනට වයස අවුරුදු 20ට නොඅඩු 35ට නොවැඩි විය යුතුයි.

(ආ) අයදුම්කරුවෝ පහත සඳහන් විභාගවලින් සමත් වී සිටිය යුත්තාහ :—

ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර පරීක්ෂණය හෝ දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර පරීක්ෂණයෙන් (සාමාන්‍ය පෙළ) විෂයයන් හයකින් ලත් සාමාර්ථ්‍යය. මෙම විෂයයන් හයෙන්. සතරක් සිංහල/දෙමළ, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ ගණිතය විය යුතුයි. භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ ගණිතයට සම්මාන සාමාර්ථය ලත් අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ඇ) පිළිගත් වෙළඳ සමාගමක හෝ රජයේ ඉංජිනේරු දෙපාර්තමේන්තුවක කර්මාන්ත ශාලා පුහුණුව පිළිබඳව යටත් පිරිසෙයින් දෙවර්ෂයක පළපුරුද්ද. එවැනි පළපුරුද්දක් සතු බව ඔප්පු කරන සහතිකයක් ඇමිණිය යුතුයි.

4. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළ කර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට 1966.6.7 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

6. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

7. නියමිත දිනට පසුව, මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත්‍ර භාර ගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අවසාන දිනට පෙර ලැබුණු බවට සහතික කර, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

8. සුදුසු ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

1966 මැයි මස දින,
කොළඹ, තැ. පෙ. 530,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලය.

5–669—66.5.20 දින අංක 14,696 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## පළාත් පාලන සේවය

1966 මාර්තු මාසය තුළදී පහත සඳහන් පත්වීම් කිරීමට පුළුවන් වීම ගැන පළාත් පාලන සේවා කොමිෂන් සභාව සතුටු වෙයි:—

### නාගරික සභා

එච්. ඊ. ආර්. පෙරේරා මහතා, වැඩ බලන සේවා අධිකාරි, කොළඹ නාගරික සභාව
කේ. ජේ. ඒ. පෙරේරා මහතා, වාර්තාකරු, (ඉංග්‍රීසි), කොළඹ නාගරික සභාව
පී. අල්විස් මහත්මිය, වාර්තාකරු (සිංහල), කොළඹ නාගරික සභාව
ඒ. යාපා මහතා, සහකාර පුස්තකාලාධිපති, කොළඹ නගර සභාව
ටී. ඇස්. ඇම්. අමිත් මහතා, II වැනි ශ්‍රේණියේ ක්‍රීඩා භූමි උපදේශක, කොළඹ නගර සභාව
ඊ. ඇස්. රාජපක්ෂ මහතා, ගබඩා භාරකරු, කොළඹ නගර සභාව
ඩබ්ලිව්. ඒ. ජේ. පෙරේරා මහතා, පෝර්මන්, කොළඹ නගර සභාව
සී. ඇම්. ඩැනියල්ස් මහතා, II වැනි ශ්‍රේණියේ වි.ලි.ප. ලිපිකරු, කොළඹ නගර සභාව
ජී. අයි. නානායක්කාර මහතා, II වැනි ශ්‍රේණියේ වි.ලි.ප. ලිපිකරු, කොළඹ නගර සභාව
ඇල්. ඒ. පී. ජයවර්ධන මහතා, II වැනි ශ්‍රේණියේ වි.ලි.ප. ලිපිකරු, කොළඹ නගර සභාව
*ඩී. සන්නසූරිය මහතා, සා.ලි.ප. ලිපිකරු, කොළඹ නගර සභාව
*ආර්. කේ. ජයරත්න මහතා, සා.ලි.ප. ලිපිකරු, කොළඹ නගර සභාව
*කේ. බී. ඇස්. ඩබ්ලිව්. පෙරේරා මෙනවිය, යතුරු ලේඛිකා (ඉංග්‍රීසි), කොළඹ නගර සභාව
ඒ. ප්‍රනාන්දු මහතා, සිංහල මොනෝ ටයිප් යතුරු පුවරු ක්‍රියාකරු, කොළඹ නාගරික සභාව
ඒ. මෝසස් මහතා, පුහුණු දෙවැනි ශ්‍රේණියේ රසායනාගාර සේවක, කොළඹ නාගරික සභාව
පී. ඒ. ඩබ්ලිව්. පෙරේරා මහතා, විශේෂ ශ්‍රේණියේ මුදල් භාරකරු, මහනුවර නාගරික සභාව
කේ. ඕ. ප්‍රනාන්දු මහතා, II වැනි ශ්‍රේණියේ වි.ලි.ප. ලිපිකරු, මීගමුව නාගරික සභාව
*ඇම්. ලීලාරත්න මහතා, සා.ලි.ප. ලිපිකරු, මීගමුව නාගරික සභාව
වී. පීටර් මහතා, II වැනි ශ්‍රේණියේ වි.ලි.ප. ලිපිකරු, යාපනය නාගරික සභාව
කේ. කර්තිගේසු මහතා, II වැනි ශ්‍රේණියේ වි.ලි.ප. ලිපිකරු, යාපනය නාගරික සභාව
ඩී. පී. ලියනගේ මහතා, II වැනි ශ්‍රේණියේ වි.ලි.ප. ලිපිකරු, දෙහිවල නාගරික සභාව
කේ. ඩී. ප්‍රනාන්දු මහතා, II වැනි ශ්‍රේණියේ කම්බිකරු, දෙහිවල නාගරික සභාව
*ආර්. ආර්. ඇස්. ප්‍රනාන්දු මහතා, සා.ලි.ප. ලිපිකරු, බදුල්ල නාගරික සභාව
එච්. ඇම්. ජේම්ස් මහතා, II වැනි ශ්‍රේණියේ කම්බිකරු, බදුල්ල නාගරික සභාව

පහත සඳහන් පත්වීම 1966 පෙබරවාරි මාසයේ දී කරන ලදී :—
*ඒ. විජේපාල මහතා, සා.ලි.ප. ලිපිකරු, කොළඹ නාගරික සභාව

### පළාත් ආණ්ඩු සභා

ජේ. ඒ. ඒ. වීරසූරිය මහතා, II වැනි ශ්‍රේණියේ වි.ලි.ප. ලිපිකරු, හලාවත ප. ආ. සභාව

*ඩබ්ලිව්. කේ. කුලරත්න මහතා, සා.ලි.ප. ලිපිකරු, ජාඇල ප. ආ. සභාව
*ඇස්. කුගදසන් මහතා, සා.ලි.ප. ලිපිකරු, මඩකලපුව ප.ආ. සභාව

පී. ඒ. ගුණවර්ධන මහතා, II වැනි ශ්‍රේණියේ කම්බිකරු, මොරටුව ප. ආ. සභාව

### සුළු නගර සභා

*කේ. පී. ජයවර්ධන මහතා, V වැනි ශ්‍රේණියේ ලේකම්, කඳාන සු. න. සභාව

*ඒ. ජේ. පී. සහබන්ධු මහතා, V වැනි ශ්‍රේණියේ ලේකම්, මොණරාගල සු. න. සභාව

ඒ. ඩී. පී. විජේතුංග මහතා, II වැනි ශ්‍රේණියේ වි.ලි.ප. ලිපිකරු, කොට්කාවත්ත සු. න. සභාව

ඒ. කිව්. අ.ර්. ජෝශප් මහතා, II වැනි ශ්‍රේණියේ වි.ලි.ප. ලිපිකරු, කල්මුනේ සු. න. සභාව

*ඩබ්ලිව්. ඒ. ඇල්. කරුණාරත්න මහතා, සා.ලි.ප. ලිපිකරු, හෝමාගම සු. න. සභාව

*ඒ. කේ. ජයසිරි මහතා, සා.ලි.ප. ලිපිකරු, බෙලිඅත්ත සු. න. සභාව

ඩබ්. බී. චන්ද්‍රසේකර මහතා, ආදයම් හා කර්මාන්ත ඕවර්සියර්, II වැනි ශ්‍රේණිය, පැල්මඩුල්ල සු. න. සභාව

කේ. ඇම්. මුතුසාමි මහතා, II වැනි ශ්‍රේණියේ කම්බිකරු, කට්ටන්කුඩි සු. න. සභාව

ඇල්. ඒ. එච්. මයිකල් මහතා, II වැනි ශ්‍රේණියේ කම්බිකරු, කැළණිය සු. න. සභාව

ඇස්. කේ. සෝමරත්න මහතා, කම්බිකරු සහායක, පිලියන්දල සු. න. සභාව

ඩබ්ලිව්. ඩී. පෙරේරා මහතා, කම්බිකරු සහායක, හික්කඩුව සු. න. සභාව

වී. කනගරත්නම් මහතා, කම්බිකරු සහායක, හිඟුරක්ගොඩ සු. න. සභාව

ඇම්. ජී. විල්සන් මහතා, කම්බිකරු සහායක, කෙහෙල්වත්ත සු. න. සභාව

කේ. ගුණතිලක මහතා, කම්බිකරු සහායක, කොච්චිකඩේ සු. න. සභාව

ඇස්. පිලිප්පුපිල්ලෙයි මහතා, කාර්යාල කාර්ය සහායක, කයිට්ස් සු. න. සභාව

එච්. පී. ජයසේන මහතා, මුරකරු, බෙන්තොට සු. න. සභාව

ඇම්. ඇම්. එච්. ආරියසිංහ බණ්ඩා මහතා, මුරකරු, දඹුල්ල සු. න. සභාව

### ගම්සභා

*පී. ඩී. වික්‍රමසිංහ මහතා, VI වැනි ශ්‍රේණියේ ලේකම්, වාකිරිගල ග. ස.

ඩී. සී. දෙඹගහදෙනිය, කාර්යාල කාර්ය සහායක, වාකිරිගල ග. ස.

*ඕ. පී. පියසේන මහතා, සා. ලි. ප. ලිපිකරු, නිවිතිගල ග. ස.

*ජේ. ඇම්. කුමාරතුංග මහතා, සා.ලි.ප. ලිපිකරු, දෙහිගම්පල් කෝරලේ මෙගොඩපොත පත්තු ග. ස.

*ඇම්. බී. ඇස්. සුනන්දරත්න මහතා, සා. ලි. ප. ලිපිකරු, ආඩිඅම්බලම ග. ස.

*එච්. ඇල්. ද සිල්වා මහතා, සා.ලි.ප. ලිපිකරු, ආඩිඅම්බලම ග. ස.

*කේ. එච්. හරිස්චන්ද්‍ර මහතා, සා.ලි.ප. ලිපිකරු, මුන්නේස්වරම් පත්තු ග. ස.

*කේ. බී. ඇල්. නන්දසේන මහතා, සා.ලි.ප. ලිපිකරු, කණුවන ග. ස.

*ඒ. ඇම්. ආරෝකියනාතන් මහතා, සා.ලි.ප. ලිපිකරු, චුලිපුරම් ග. ස.

*පී. බී. මාවලගෙදර මහතා, සා.ලි.ප. ලිපිකරු, කළුපිටපත්තු ග. ස.

*ඩබ්ලිව්. ඒ. සයිමොන් මහතා, සා.ලි.ප. ලිපිකරු, එගොඩපත්තු ග. ස.

*ඇම්. ඩබ්. ඒ. ඩී. පී. විජේසූරිය මහතා, සා.ලි.ප. ලිපිකරු, ඔයපලාත (නු.එ.) ග. ස.

යූ. ඩබ්. කේ. අමරසිරි මහතා, II වැනි ශ්‍රේණියේ ආයුර්වේද වෛද්‍ය, ඇටම්පිටිය ග. ස.

ආර්. ඒ. ඩබ්. ඇස්. රනසිංහ මහතා, II ශ්‍රේණියේ ආදායම් හා කර්මාන්ත ඕවර්සියර්, උඩඩියන්කුලම කෝරලේ ග. ස.

කේ. ඩී. බී. ඇල්. ගුණරත්න මහතා, II ශ්‍රේණියේ ආදයම් හා කර්මාන්ත ඕවර්සියර්, කිවුලගෙදර ග. ස.

ටී. ඩබ්ලිව්. අමරවීර මහතා, II ශ්‍රේණියේ ආදයම් හා කර්මාන්ත ඕවර්සියර් කළුපිටපත්තු ග. ස.

කේ. ජී. දයාරත්න මහතා, II ශ්‍රේණියේ ආදයම් හා කර්මාන්ත ඕවර්සියර්, ගහපලාත (නු.එ.) ග. ස.

ඇල්. එච්. ධනපාල මහතා, II ශ්‍රේණියේ ආදයම් හා කර්මාන්ත ඕවර්සියර් දෙහිවත්ත ග. ස.

ඇල්. ඇම්. සියාතුබණ්ඩා මහතා, II ශ්‍රේණියේ ආදයම් හා කර්මාන්ත ඕවර්සියර්, ගහල උඩසියපත්තු ග. ස.

ආර්. පී. ඇන්. ගුණදස මහතා, II ශ්‍රේණියේ ආදයම් හා කර්මාන්ත ඕවර්සියර්, කොළොන්නගම්පත්තු ග. ස.

ඒ. ජී. වික්‍රමතුංග මහතා, II ශ්‍රේණියේ ආදයම් හා කර්මාන්ත ඕවර්සියර්, වාරියපොල ග. ස.

වී. මානික්කම් මහතා, II ශ්‍රේණියේ ආදයම් හා කර්මාන්ත ඕවර්සියර්, තම්පලකාමම් ග. ස.

බී. ඇල්. ධර්මසේන මහතා, II ශ්‍රේණියේ ආදයම් හා කර්මාන්ත ඕවර්සියර්, මැදපලාත (ය.නු.) ග. ස.

පී. ඩබ්ලිව්. සිරිනන්ද මහතා, II ශ්‍රේණියේ ආදයම් හා කර්මාන්ත ඕවර් සියර්, පහළගම්හය ග. ස.

ඩබ්ලිව්. ඇම්. වීරකෝන් බණ්ඩා මහතා, II ශ්‍රේණියේ ආදයම් හා කර් මාන්ත ඕවර්සියර්, මාවත පත්තු ග. ස.

බී. සිරිසේන මහතා, II වැනි ශ්‍රේණියේ කර්මාන්ත ඕවර්සියර්, වලව ග. ස.

ඇම්. පී. ප්‍රනාන්දු මහතා, II වැනි ශ්‍රේණියේ කම්බිකරු, ගන්දෙළහ පත්තු ග. ස.

ඒ. විජේරත්න මහතා, II වැනි ශ්‍රේණියේ කම්බිකරු, පන්තඩකෙරිප්පු, ග. ස.

ඇස්. ඒ. ඒ. පෙරේරා මහතා II වැනි ශ්‍රේණියේ කම්බිකරු, අච්චුවැලි ග. ස.

ආර්. ඇම්. ඇල්බට් මහතා, II වැනි ශ්‍රේණියේ කම්බිකරු, අඹගමුව දකුණ ග. ස.

ඊ. ආර්. රාජරත්නම් මහතා, කම්බිකරු, සහායක, අඹගමුව දකුණ ග. ස

ඇන්. ඇම්. පුංචි අප්පුහාමි මහතා, කම්බිකරු සහායක, ඕතර සහ ගන් දෙළහ පත්තු ග. ස.

ඇම්. වී. ඒ. ප්‍රනාන්දු මහතා, කම්බිකරු සහායක, අතුරුගිරිය ග. ස.

ඩබ්ලිව්. ඇම්. ජයසිංහ මහතා, කාර්යාල කාර්ය සහායක, පොල්පිතිගම ග. ස.

ඩී. ඇම්. අබේකෝන් මහතා, කාර්යාල කාර්ය සහායක, නුවරගම් කෝරළේ උතුර ග. ස.

කේ. ජී. සෝමදස මහතා, කාර්යාල කාර්ය සහායක, අපරැක්ක–බඹරැන්ද ග. ස.

යූ. එච්. ඇම්. ඩිංගිරි බණ්ඩා මහතා, කාර්යාල කාර්ය සහායක, අග්බෝපුර, ග. ස.

ජී. බී. රූපසිංහ මහතා, කාර්යාල කාර්ය සහායක, සියඹලාඩුව, ග. ස.

ඇස්. ඇම්. ධර්මසිරි මහතා, කාර්යාල කාර්ය සහායක, උලගල්ල කෝරලේ උතුර ග. ස.

ඩී. එච්. ඒකනායක මහතා, කාර්යාල කාර්ය සහායක, මීද්දෙණිය හ. ස.

පී. වයි. සුමණසිරි මහතා, කාර්යාල කාර්ය සහායක, ගෝනාපීනුවල මීටියාගොඩ ග. ස.

එච්. ඒ. ඇස්. පෙරේරා මහතා, මුරකරු, පුත්තලම් පත්තු ග. ස.

පහත සඳහන් පත්වීම 1966 පෙබරවාරි මාසයේ දී කරන ලදී :—

ඇස්. අයියදුරෙයි මහතා, II වැනි ශ්‍රේණියේ කම්බිකරු, කෝපේ ග. ස.
*මෙම පත්වීම් කරන ලද්දේ විභාග ප්‍රතිඵල අනුවය.

ඩබ්ලිව්. ඒ. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

1966 මැයි මස 12 වැනි දින,
තැ. පෙ. 530,
කොළඹ.

# පළාත් පාලන සහා ඡන්ද ආඥපනත යටතේ දැන්වීම්

## ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥපනත

**(262 වැනි අධිකාරය)**

**කොළඹ දිස්ත්‍රික්කය**

### කඹුවන ගම් සභාව

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥපනතේ (262 වැනි අධිකාරය වන) 36 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලබන්නේ, කඹුවන ගම් සභාවේ අංක 22 දරණ කොට්ඨාශය වෙනුවෙන් පෙනී සිටීම සඳහා නෙත්තිසිංහ අප්පුහාමිලාගේ මෝසස් පෙරේරා මහතා ඡන්දයෙන් තෝරා පත් කර ගන්නට යෙදුන බවය.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්,
(ප්‍රාදේශීය බලමණ්ඩල).

1966 මැයි 6 වැනි දින,
කොළඹ දී ය.

5-657—66.5.20 දින අංක 14,696 දරන ගැසට් පත්‍රය

---

# අය වැය ලේඛන

## දෙව්නුවර සුළු නගර සභාව

**අංක 40 (ii) දරණ සුළු නගර සභා මුදල් රෙගුලාසි යටතේ කෙරෙන ඉල්ලීමයි**

අය වැය ලේඛනය—1966

**ඉතිරි වැය**

| | රු. | ශ. |
|---|---|---|
| සී.—සභා ගොඩනැගිලි සහ ඉඩම්— | | |
| (1) වැටුප් ... ... ... | 184 | 0 |
| | 184 | 0 |

**අතිරේක වැය**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම්— | | |
| (2) කාර්යාලීය වියදම් (ඇල්) අතිකාල දීමනා ... | 184 | 0 |
| | 184 | 0 |

ඉහත සඳහන් අතිරේක අය වැය ලේඛනය 1966 ජනවාරි 29 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී සභා සම්මත කර ගන්නා ලදී.

හෙ. වී. ඩික්සන් සිල්වා,
සභාපති,
දෙව්නුවර සුළු නගර සභාව.

1966 මැයි 7 වැනි දින දෙව්නුවර සුළු නගර සභා කාර්යාලයේ දී ය. .

5-678—66.5.20 වැනි දින අංක 14,696 දරන ගැසට් පත්‍රය

---

## පැල්මඩුල්ල සුළු නගර සභාව

**1966 වර්ෂයේ අංක 1 දරණ පරිපූරක වැය ඇස්තමේන්තුව**

### වියදම සැදුණු ආකාරය

ඒ.—සාමාන්‍ය :—

(2) සංස්ථා වියදම්—

| | රු. | ශ. |
|---|---|---|
| (සී) අයකැමි ගාස්තු: හිග හිට ඇති දේපොල හා කැළි කශල ශොධන බදු අයකරවීම පිණිස කොමිස් ගෙවීමේ ක්‍රමයට බදු අයකරන්නන්ට ගෙවීම ... ... | 1,000 | 0 |
| (4) ආධාර හා දීමනා: විශ්‍රාම වැටුප් යටතේ උපලේඛණ ගත නොවූ සේවකයින් වෙනුවෙන් සේවක අර්ථ සාධක අර මුදලට ගෙවීමට සිදුවෙන මුදල් (මේ සඳහා අයවැය කෙටුම්පතේ මුදල් වෙන්කර නැත) ... ... | 1,000 | 0 |
| එකතුව ... | 2,000 | 0 |

### I කොටස—සාමාන්‍ය

| වැය ශීර්ෂයෝ | යෝජිත වැය රු. ශ. | එකතුව රු. ශ. |
|---|---|---|
| ඒ—සාමාන්‍ය :— | | |
| (2) සංස්ථා වියදම්— | | |
| (සී) අයකැමි ගාස්තු ... | 1,000 0 ... | |
| (4) ආධාර හා දීමනා ... ... | 1,000 0 | |
| | | 2,000 0 |

1966 ක්වූ පෙබරවාරි මස 28 වෙනිදින පැවැත්වූ පැල්මඩුල්ල සුළු නගර සභාවේ රැස්වීමේ අංක 11 දරණ සම්මුතියෙන් පළාත් පාලන සහකාර කොමසාරිස් තුමාගේ සංශෝධනයන්ට යටත්ව මෙම පරිපූරක වැය ඇස්තමේන්තුව පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

ඒ. සී. ඇම්. ඒ. මරික්කාර්,
පැල්මඩුල්ල සුළු නගර සභාවේ සභාපති.

1966 අප්‍රේල් මස 18 වෙනි දින,
පැල්මඩුල්ල සුළු නගර සභා කාර්යාලයේදීය.

අනුමත කරමි.

ඇල්. ජී. සිරිවර්ධන,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
සබරගමු පෙදෙස.

1966.5.9 දින රත්නපුර,
පළාත් පාලන කාර්යාලයේදීය.

5-677—66.5.20 දින අංක 14,696 දරන ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## ගෙවල් කුලී සීමා පනත

### රත්නපුර සුළු නගර සභා ප්‍රදේශය

1949 අප්‍රේල් මස 22 වෙනි දින අංක 9,969 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලවූ 1949 ගෙවල් කුලී සීමා රෙගුලාසිවල අංක 3 දරණ රෙගුලාසිය අනුව කෙරෙන දැනුම් දීමයි. (274 පරිච්ඡේදය වන) ගෙවල් කුලී සීමා පනතේ විධි විධාන අනුව, රත්නපුර නගර සභා ප්‍රදේශයට සීමිත වූ ගෙවල් කුලී පාලක මණ්ඩලය වෙත එවනු ලබන ඉල්ලුම් පත්‍ර පහත සඳහන් කරනු ලබන ලිපිනයට එවිය යුතුය :—

" සභාපති තුමා,
ගෙවල් කුලී පාලක මණ්ඩලය,
" ස්වස්තිකා ",
" පොත්ගල් විහාර මාවත,
රත්නපුර. "

2. මෙම ආඥාපණත යටතේ යථෝක්ත මණ්ඩලය වෙත ලැබෙන අයදුම්පත් සලකා බැලීම සඳහා මණ්ඩලයේ සභා රැස්වීම් පහත සඳහන් කරනු ලබන ස්ථානයෙහි පවත්වනු ලැබේ :—

රැස්වීම් ශාලාව,
නගර සභාව, රත්නපුර.

3. මේ සම්බන්ධයෙන් 61.4.28 වෙනි දින අංක 12,395 දරණ ගැසට් පත්‍රයේ පලවූ දැන්වීම මෙයින් අවලංගු කරමි.

පාලිත වනසුන්දර,
රත්නපුර ගෙවල් කුලී පාලක මණ්ඩලයේ සභාපති.

1966 අප්‍රේල් මස 22 වැනි දින,
රත්නපුරේදීය.

5–673—66.5.20 දින අංක 14,696 දරන ගැසට් පත්‍රය

---

## 1952කේ අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩපළාත කඳුකර ඉහළ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ.

### යෝජනාව

පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1963 ජූනි මස 21 වෙනි දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූ උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1965 ජනවාරි මස 8 වෙනි දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයේ ප්‍රකාශ කරන ලද්දාවූ ද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 38 වෙනි කාණ්ඩය මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට කඳුකර ඉහළ ගම්සභාව විසින් පළාත් පාලන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාව) පනතේ (261 වන අධිකාරය) 3 වන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ඇම්. ජී. කරුණාදාස,
සභාපති,
උඩපළාත කඳුකර ඉහළ ගම්සභාව.

1965 දෙසැම්බර් මස 27 දින,
ගම්සභා කාර්යාලය, අටබාගේ.

5–658—66.5.20 දින අංක 14,696 දරන ගැසට් පත්‍රය

---

## ජාඇල නගර සභාව

### 1966 වර්ෂය සඳහා වූ වරිපනම් බද්ද

1966.3.18 වැනි දින අංක 14,687 දරණ ගැසට් පත්‍රයේ IV වෙනි කොටසේ ජාඇල නගර සභාවේ 1966 වර්ෂය සඳහා වූ වරිපනම් බද්ද යන හිසින් වූ දැන්වීමෙහි "චංචල" යන වචනය "නිශ්චල" යනුවෙන් නිවැරදි විය යුතු බව මෙයින් දැනුම් දෙමි.

ඇලොයි වාස්,
ජාඇල නගර සභාවේ සභාපති.

1966 අප්‍රේල් මස 20 වැනි දින,
ජාඇල නගර සභා කාර්යාලයේ දීය.

5–663—66.5.20 දින අංක 14,696 දරන ගැසට් පත්‍රය

---

## අලව්ව ගම්සභා ප්‍රදේශයේ ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානයේදී 1966 වර්ෂයේ මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා බලපත්‍ර ඉල්ලා අයදුම් පතක් මා වෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පනතේ 201 වෙනි පරිච්ඡේදයේ 1947 අංක 44 දරණ සංශෝධිත ආඥා පනතේ 6 වෙනි වගන්තිය සංශෝධනය කරන ලද 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍රය නිකුත් කිරීම ගැන අලව්ව ගම්ප්‍රදේශයේ ගම්සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇ එසේ විරුද්ධ වන්නේ කුමන හේතූන් නිසාද යනවග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් තුළදී මා වෙත එවිය යුතු බැව් මෙයින් දන්වා සිටිමි.

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳම කරන ස්ථානය | වෙළඳම |
|---|---|---|
| හේ. මු. ඇ. රත්නායක මහතා අළුත් පාර, අලව්ව. | ...මහතා,අලව්ව නගරයේ | ...එළු මස් සහ හරක් මස් |

යූ. බී. අලව්ව,
අලව්ව ගම්සභාවේ සභාපති.

1966 මැයි මස 9 වෙනි දින,
අලව්ව ගම්සභා කාර්යාලයේදීය.

5–676—66.5.20 දින අංක 14,696 දරන ගැසට් පත්‍රය

---

## වෙන්නප්පුව සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

සුළු නගර සභා ආඥාපනතේ (256 වැනි අධිකාරිය) අංක 161 සහ 163 දරණ වගන්ති යටතේ වෙන්නප්පුව සුළු නගර සභාව විසින් පහත සඳහන් උප ලේඛනයෙහි විස්තර වන බලපත්‍ර ගාස්තු මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට පනවනු ලබන බව මෙයින් දන්වනු ලැබේ.

සිඩ්නි ප්‍රනාන්දු,
වෙන්නප්පුව සුළු නගර සභාවේ සභාපති.

සුළු නගර සභා කාර්යාලය,
වෙන්නප්පුව, 22.4.66.

### උපලේඛනය

| බලපත්‍රයේ විස්තර | වාර්ෂික ගාස්තු රු. ශ. |
|---|---|
| කම්මලක් හෝ කම්මල් ලිපක් පවත්වාගෙන යාම ... | 3. 50 |
| භූමිතෙල් හෝ ඩීසල් තෙල් හෝ පැට්‍රල් ගබඩාවක් ... පවත්වාගෙන යාම ... ... | 35. 00 |
| මුද්‍රණාලයක් පවත්වාගෙන යාම ... ... | 25. 00 |
| විදුලි වැඩකරණ වැඩපලක් පවත්වාගෙන යාම ... | 20. 00 |
| යන්ත්‍ර මාර්ගයෙන් හෝ සෙක්කු මාර්ගයෙන් තෙල් ... සිඳීම ... ... ... | 20. 00 |
| ඡායාරූප ගන්නා ස්ථානයක් හෝ චිත්‍රපටි නිපදවන ... ස්ථානයක් පවත්වාගෙන යාම ... ... | 20. 00 |
| මෝටර් රථ අළුත්වැඩියා කිරීම හෝ සර්විස් කිරීම ... | 30. 00 |

5–674—66.5.20 දින අංක 14,696 දරන ගැසට් පත්‍රය

## බලන්ගොඩ නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (272 වැනි අධිකාරය) 17 (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය ප්‍රකාර, නියමිත අධිකාරිතැනවූද, බලන්ගොඩ නගර සභාවේ සී. එස්. රත්වත්තේ වන මම, 1966 වර්ෂයේදී පහත දක්වෙන උපලේඛනයෙහි සඳහන් දිනවලදී බලන්ගොඩ නගර සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම සහ මස් විකිණීම මෙයින් සම්පූර්නයෙන්ම තහනම් කරමි :—

### උපලේඛනය

මැයි 4, 5, 11, 18, 26.

ජූනි 2, 3, 10, 17, 25.

ජූලි 2, 9, 16, 24, 31.

අගෝස්තු 8, 15, 23, 30.

සැප්තැම්බර් 6, 13, 21, 28.

ඔක්තෝබර් 4, 6, 13, 21, 28.

නොවැම්බර් 4, 11, 19, 26.

දෙසැම්බර් 4, 11, 19, 26.

සී. එස්. රත්වත්තේ,
සභාපති,
බලන්ගොඩ නගර සභාව.

1966 අප්‍රේල් මස 20 වෙනි දින,
බලන්ගොඩ නගර සභා කායතීලයේදීය.

5-662—66.5.20 දින අංක 14,696 දරන ගැසට් පත්‍රය

---

## ජලභීතිකා රෝගය

අළුත්ගම සුළුනගර සභා සීමාව තුල ජලභීතිකා රෝග උවදුර පවතින බැවින්, මෙම නගරසභා සීමාව තුල පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙම්දුලක හෝ ගෙවත්තක නොවූ අන් ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හමුවන දඩාවතේ යන නැතහොත් දක්කාගෙන නොයනු ලබන කිසියම් සුනඛයකු, (බල්ලෙකු හෝ බැල්ලියකු) මා විසින් ලිය විල්ලකින් දෙන ලද බලය ලත් අයෙකු විසින් ඒවේලේම විනාශ කරනු ලබන බව ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් පිළිබඳ "ජල භීතිකා ආඥපනතේ" (333 වැනි පරිච්ඡේදය) 11 වෙනි වගන්තිය ප්‍රකාර මෙයින් ප්‍රකාශනය කරනු ලැබේ.

මෙම ප්‍රකාශනය 1966 මැයි මස 15 වෙනි දින සිට 1966 නොවැම්බර් මස 15 වෙනි දින දක්වා වලංගුව පවතී.

ජී. ඇල්. ටී. ද සිල්වා,
අළුත්ගම සුළු නගර සභාවේ සභාපති.

66. 5. 13 දින,
අළුත්ගම සුළුනගර සභා කායතීලයේදීය.

5-655—66.5.20 දින අංක 14,696 දරන ගැසට් පත්‍රය

---

## වෙන්නප්පුව සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥපනත

256 වෙනි අධිකාරය වන සුළු නගර සභා ආඥපනතේ 161 සහ 163 වෙනි වගන්ති යටතේ වෙන්නප්පුව සුළු නගර සභාව විසින් මෙහි පහත සඳහන් උප ලේඛනයේ දක්වා ඇති බලපත්‍ර ගාස්තු ඒ ඒ ව්‍යාපාරයන් සඳහා මෙතෙක් අයකළ බලපත්‍ර ගාස්තු වෙනුවට මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවූ දින සිට පනවා අයකරනු ලබන බව මෙයින් දැනුම් දෙමි.

සිඩ්නි ප්‍රනාන්දු,
වෙන්නප්පුව සුළු නගර සභාවේ සභාපති.

සුළු නගර සභා කාර්යාලය,
වෙන්නප්පුව, 22.4.1966.

### උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 1. බේකරියක් සඳහා | ... | ... | රු. 25.00 |
| 2. හෝටලයක් සඳහා | ... | ... | රු. 25.00 |

5-672—66.5.20 දින අංක 14,696 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස්වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් බාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ.

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් බාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

### උපලේඛනය

**1966**

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| මාර්තු ... | 66. 3. 4 | සිකුරාද ... | 66. 2.25 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 3.11 | සිකුරාද ... | 66. 3. 4 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 3.18 | සිකුරාද ... | 66. 3.11 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 3.25 | සිකුරාද ... | 66. 3.17 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| අප්‍රේල් ... | 66. 4. 1 | සිකුරාද ... | 66. 3.25 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 4. 7 | බ්‍රහස්පතින්ද ... | 66. 3.31 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66. 4.15 | සිකුරාද ... | 66. 4. 1 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 4.22 | සිකුරාද ... | 66. 4.15 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 4.29 | සිකුරාද ... | 66. 4.22 | සිකුරාද | ප.ව. 3.30 |
| මැයි | 66. 5. 6 | සිකුරාද ... | 66. 4.26 | අඟහරුවාද | දවල් 12 |
| | 66. 5.13 | සිකුරාද ... | 66. 5. 6 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 5.20 | සිකුරාද ... | 66. 5.13 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 5.27 | සිකුරාද ... | 66. 5.20 | සිකුරාද | ප.ව. 3.30 |
| ජූනි ... | 66. 6. 3 | සිකුරාද ... | 66. 5.25 | බදාද | දවල් 12 |
| | 66. 6. 9 | බ්‍රහස්පතින්ද ... | 66. 6. 1 | බදාද | දවල් 12 |
| | 66. 6.16 | බ්‍රහස්පතින්ද ... | 66. 6. 9 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66. 6.24 | සිකුරාද ... | 66. 6.16 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| ජූලි ... | 66. 7. 1 | සිකුරාද ... | 66. 6.24 | සිකුරාද | දවල් 12 |
| | 66. 7. 8 | සිකුරාද ... | 66. 7. 1 | සිකුරාද | දවල් 12 |
| | 66. 7.15 | සිකුරාද ... | 66. 7. 8 | සිකුරාද | දවල් 12 |
| | 66. 7.22 | සිකුරාද ... | 66. 7.14 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66. 7.29 | සිකුරාද ... | 66. 7.22 | සිකුරාද | ප.ව. 3.30 |
| අගෝස්තු ... | 66. 8. 5 | සිකුරාද ... | 66. 7.29 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 8.12 | සිකුරාද ... | 66. 8. 5 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 8.19 | සිකුරාද ... | 66. 8.12 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 8.26 | සිකුරාද ... | 66. 8.19 | සිකුරාද | ප.ව. 3.30 |
| සැප්තැම්බර් ... | 66. 9. 2 | සිකුරාද ... | 66. 8.26 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9. 9 | සිකුරාද ... | 66. 9. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.16 | සිකුරාද ... | 66. 9. 9 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.23 | සිකුරාද ... | 66. 9.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.30 | සිකුරාද ... | 66. 9.23 | සිකුරාද | ප.ව. 3.30 |
| ඔක්තෝබර් ... | 66.10. 7 | සිකුරාද ... | 66. 9.30 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.14 | සිකුරාද ... | 66.10. 7 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.20 | බ්‍රහස්පතින්ද ... | 66.10.14 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.27 | බ්‍රහස්පතින්ද ... | 66.10.20 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| නොවැම්බර් ... | 66.11. 3 | බ්‍රහස්පතින්ද ... | 66.10.27 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.10 | බ්‍රහස්පතින්ද ... | 66.11. 3 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.18 | සිකුරාද ... | 66.11.10 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.25 | සිකුරාද ... | 66.11.18 | සිකුරාද | දවල් 12 |
| දෙසැම්බර් ... | 66.12. 2 | සිකුරාද ... | 66.11.24 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66.12. 9 | සිකුරාද ... | 66.12. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.12.16 | සිකුරාද ... | 66.12. 8 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66.12.23 | සිකුරාද ... | 66.12.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.12.30 | සිකුරාද ... | 66.12.22 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |

**1966 පෙබරවාරි 17 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.**

**බර්නාඩ් ද සිල්වා,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංස්ථාවෙහි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි